13 වෙළුම
1 කලාපය
2017
ජනවාරි-මාර්තු

# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්තිය සැමරේ

1966 වර්ෂයේදී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්ති සංවත්සර උත්සවය 2016 සැප්තැම්බර් මස 08 වැනි දින කොළඹ ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරයේදී උත්සවාකාරයෙන් පවත්වන ලදි. පහත සඳහන් අංගවලින් සමන්විත වූ මේ උත්සවයට ආරාධිතයන් හා සංගමයේ සාමාජිකයන් 140 කට අධික පිරිසක් සහභාගි වූහ.

- **ස්වර්ණ ජයන්ති උපහාර ප්‍රණාම පිරිනැමීම**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව හා ඉතිහාසය යන ක්ෂේත්‍රයන්හිද, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය වෙනුවෙන්ද ඉටු කළ විශිෂ්ට සේවය වෙනුවෙන් මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ හා මහාචාර්ය විනී විතාරණ යන මහත්වරුන් වෙනුවෙ'න් 'ස්වර්ණ ජයන්ති උපහාර ප්‍රණාම' සම්මානය පිරිනැමීම ස්වර්ණ ජයන්ති උත්සවයේ ප්‍රධාන අංගයක් විය.







සංගමයේ 2006-2015 දක්වා සභාපති ධූරය දැරූ මහාචාර්ය විනී විතාරණ මහතා වෙනුවෙන් උපහාර ප්‍රණාම පුදකිරීම සඳහා වූ හේතු පාඨය යොහාන් ෆෙරෙයිරා මහතා විසින් කියැවීමෙන් පසු සංගමයේ සභාපති ආචාර්ය මහින්ද පී. මලලසේකර මහතා විසින් විනී විතාරණයන් වෙත උපහාර ඵලකය පිරිනමන ලදි. ඉන් පසුව 1993-2006 දක්වා සංගමයේ සභාපති ධූරය දැරූ මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා උදෙසා උපහාර ප්‍රණාම පුදකිරීම සඳහා වූ හේතු පාඨය මුදිත කරුණාමුනි මහතා විසින් කියවන ලදි. මහාචාර්ය වික්‍රමගමගේ මහතා නියෝජනය කළ සිරිසේන විතානගේ මහතා ආචාර්ය මලලසේකර මහතා වෙතින් උපහාර ඵලකය පිළිගත්තේය.

- **ස්වර්ණ ජයන්ති සංවත්සර සමරු මුද්දරය හා මුල්දින කවරය**

සංගමයේ ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් සමරු මුද්දරයක් හා මුල්දින කවරයක් සංවත්සර උත්සව අවස්ථාවේදී නිකුත් කරන ලදි. මුද්දරය සඳහා සංගමයේ විධායක සභාව විසින් තෝරා ගන්නා ලද්දේ කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත්ව ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ වෙහෙරගලින් ලැබුණු, රන් ආලේපිත ලෝකඩ අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාවේ ඡායාරූපයකි.




පුරාවිද්‍යා සංගමයේ ඉල්ලීම මත ඒ සඳහා සිය කාරුණික අවසරය ලබාදුන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ සනූජා කස්තුරිආරච්චි මහත්මියට සංගමයේ ස්තුතිය හිමි වේ.

## මාසික වැඩසටහන්


ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස දෙක තුළ පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **ජනවාරි 08 ඉරිදා ප.ව. 2.00ට**

අධ්‍යයන චාරිකාව :

**දෙහිවල, කරගම්පිටිය සුබෝධාරාමයේ චිත්‍ර හා මොසෙයික් නිර්මාණ අධ්‍යයනය සඳහා වන අධ්‍යයන චාරිකාව**

කරුණාකර ප.ව. 2.00ට එම විහාරයට පැමිණෙන්න. (සිතියම පහත දැක්වේ.)




- **පෙබරවාරි 12 ඉරිදා ප.ව. 2.30ට**

දේශන මාතෘකාව:

**සීගිරි සිතුවම් ඇසුරින් හමුවූ අඟුරු පාදක කරගනිමින් එම සිතුවම් කාල නිර්ණය කිරීම**

දේශක:

**ටී. කේ. විජේසිංහ මහතා**

(හිටපු පර්යේෂණ නිලධාරි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)


- **මාර්තු මාසයේදී පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ විස්තර පසුව දනුම් දෙනු ලැබේ.**

**ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහලේ)**

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

ඒ අනුව රු. 15/=ක වටිනාකමින් යුක්ත තැපැල් මුද්දරයක් ස්වර්ණ ජයන්ති සංවත්සර උත්සවය අවස්ථාවේදී නිකුත් කිරීමට හැකියාව ලැබිණි.

මේ කාර්යය සාර්ථක කරගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේන්ද සුවිශේෂ දායකත්වයක් ලැබිණි. එසේම මේ කාර්යයේදී දක්වූ කාරුණික අනුග්‍රහය වෙනුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර උපදේශක මණ්ඩලයට, තැපැල්පති රෝහණ අභයරත්න, මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ එඩ්. වී. ඩී. අයි. අබේවික්‍රම සහ චන්න මුණසිංහ යන මහත්වරුන්ට සංගමයේ ස්තුතිය හිමි වේ.




- **ස්වර්ණ ජයන්ති රචනා තරඟය**

සංගමයේ ස්වර්ණ ජයන්තිය නිමිත්තෙන් 'ශ්‍රී ලංකා පුරාවිද්‍යාවේ නව ප්‍රවණතා' හා 'පුරාවස්තු කොල්ලය වළක්වමු' යන මාතෘකා ඔස්සේ විවෘත රචනා තරඟයක් සංවිධානය කරන ලදි. ඒ පිළිබඳව දිවයින, රිවිර හා මව්බිම යන පුවත්පත්වල 2015 නොවැම්බර් මාසයේදී පළ කළ නිවේදනවලට ප්‍රතිචාර ලෙස රටේ විවිධ ප්‍රදේශවලින් සංගමය වෙත රචනා නිර්මාණ එවා තිබිණි. එම නිර්මාණ ඇගැයීමට ලක් කිරීමෙන් පසු පළමු, දෙවන හා තෙවන ස්ථාන හිමිකරගත් අය සඳහා ත්‍යාග වවුචර්, පොත් කට්ටල හා සහතික ස්වර්ණ ජයන්ති උත්සව දින ප්‍රදානය කරන ලදි. එසේම රචනා තරඟයේදී දක්වූ කුසලතා සඳහා තවත් තරඟකරුවන් 11 දෙනෙකු සඳහා සහතික හා පොත් කට්ටල පිරිනමන ලදි.

  - ප්‍රථම ස්ථානය - ඩී. එම්. පියුමි හංසනී, කටුවන
  - දෙවන ස්ථානය - කේ. ඒ. චානි දේශිකා, මතුගම
  - තෙවන ස්ථානය - කේ. ඒ. නදීකා තරංගනී, අකුරැස්ස

- **ස්වර්ණ ජයන්ති සම්මන්ත්‍රණය**

මෙරට පුරාවිද්‍යාවේ ප්‍රධාන අංශවල මෑතකාලීන ප්‍රවණතා පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමේ අරමුණින් පවත්වන ලද මෙම සම්මන්ත්‍රණය සංවත්සර උත්සවයට සමගාමීව පවත්වන ලදි. එය පහත සඳහන් දේශන තුනෙන් සමන්විත විය.

  - **මෑතකාලීන ප්‍රාග් හා පූර්ව ඓතිහාසික පර්යේෂණ** යන මැයෙන් ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ **ආචාර්ය තුසිත මෙන්ඩිස්** මහතා දේශනයක් පවත්වමින් මේ විෂය පිළිබඳව මූලික කරුණු පැහැදිලි කිරීමක්ද, මෑතකාලයේ මෙරට තුළ සිදුකර ඇති පර්යේෂණ සම්බන්ධව සමාලෝචනයක් ද ඉදිරිපත් කළේය.
  - **මෑතකාලීන වාස්තු විද්‍යාත්මක කටයුතු** පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) **ප්‍රසන්න රත්නායක** මහතා සිදු කළ දේශනයේදී කරුණු දක්වන ලද්දේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතකාලයේදී සිදුකරන ලද වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ කටයුතු පිළිබඳවය.
  - **මෑතකාලීන අභිලේඛන පර්යේෂණ** යන මාතෘකාව යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ **මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි** මහතා පවත්වන ලද දේශනයේදී අවධානය යොමු කරන ලද්දේ මෑත භාගයේදී මෙරට අභිලේඛන විෂය පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ සමබන්ධවය.

- **ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා 6 වැනි වෙළුම එළිදැක්වීම**

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා 6 වැනි වෙළුම විශේෂ කලාපයක් ලෙස ස්වර්ණ ජයන්ති සංවත්සරය වෙනුවෙන් ප්‍රකාශයට පත් කිරීමද මෙදින සිදුවිය. සාමාජිකයන් හා වෙනත් විද්වතුන් විසින් සම්පාදනය කරන ලද ශාස්ත්‍රීය ලිපි හයකින් හා පණස් වන සංවත්සරය වෙනුවෙන් සකස් කරන ලද විශේෂ අතිරේකයකින් මෙම සංහිතා කලාපය සමන්විත විය. එහි අන්තර්ගතය හා එය ලබාගැනීම පිළිබඳ විස්තර සඳහා පුවත් හසුනේ 3 වන පිටුව බලන්න.

**ස්තුතිය -** ස්වර්ණ ජයන්තියේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා දායක වූ හා සංවත්සර උත්සවයට සහභාගි වූ සියලු දෙනාට සංගමය ස්තුතිය පළ කරයි. සංවත්සර උත්සවයේ ඉහත සඳහන් අංග සාර්ථක කරගැනීම සඳහා දායක වූ පහත නම් සඳහන් විධායක සභිකයන්ට විශේෂ ස්තුතියක් හිමි වේ.

- ස්වර්ණ ජයන්ති උපහාර ප්‍රණාමය සම්බන්ධීකරණය **-** ආචාර්ය මහින්ද පී. මලලසේකර, සංජීවනී විද්‍යාරත්න, මුදිත කරුණාමුනි හා යොහාන් ෆෙරෙයිරා
- තැපැල් මුද්දරය හා මුල්දින කවරය සම්බන්ධීකරණය - ආචාර්ය මහින්ද පී. මලලසේකර, ආචාර්ය කාවන් රත්නතුංග, මුදිත කරුණාමුනි, සංජීවනී විද්‍යාරත්න සහ ධනේෂ් විසුම්පෙරුම
- රචනා තරඟයේ සම්බන්ධීකරණය හා සමීක්ෂණය - සංජීවනී විද්‍යාරත්න හා රචනා සමීක්ෂණය - රුක්ෂිලා වෙත්තමුනි
- සම්මන්ත්‍රණය සම්බන්ධීකරණය - සංජීවනී විද්‍යාරත්න හා ධනේෂ් විසුම්පෙරුම
- සංහිතා සඟරාවේ සංස්කාරක - ධනේෂ් විසුම්පෙරුම

සමස්ත ස්වර්ණ ජයන්ති සංවත්සර කටයුතු සංවිධානය කිරීම සඳහා දායක වූ සංගමයේ විධායක සභිකයින් සියලු දෙනාටම ස්තුතිය හිමි වේ. මෙහිදී සංගමයේ ගරු සමලේකම් කේ. බැනට් ප්‍රනාන්දු, ගරු භාණ්ඩාගාරික ලක්ෂ්මන් රත්නායක යන මහත්වරුන්ද, ගරු කාරකසභිකයින් වන හරිශ්චන්ද්‍ර ඉද්දගොඩ හා සිරිල් ආරියපාල යන මහත්වරුන්ටද සංගමයේ විශේෂ ස්තුතිය හිමි වේ. එමෙන්ම මුදලින් ආධාර කිරීමෙන් සංවත්සරය සාර්ථක කරගැනීම සඳහා දායක වූ සාමාජික සාමාජිකාවන් සියලු දෙනාටම අපගේ ස්තුතිය හිමි වේ. (ඔවුන්ගේ නම් සඳහා පුවත් හසුනේ 4වැනි පිටුව බලන්න)

- සංවත්සර දින වැඩසටහන් සංවිධානය - සංජීවනී විද්‍යාරත්න, සිරිල් ආරියපාල, ක්‍රිෂේන් මෙන්ඩිස්, චතුර දම්රුවන් හා එච්. ඩී. දිනේෂ් යන සංගමයේ සාමාජික-සාමාජිකාවන්ට මේ සඳහා විශේෂයෙන් ස්තුති කරමු.
- ඡායාරූපකරණය හා සමාජ මාධ්‍ය ප්‍රචාරණය - අනුරාධ පියදාස, රුක්ෂිලා වෙත්තමුනි, යොහාන් ෆෙරෙයිරා හා සිරිල් ආරියපාල යන සාමාජික සාමාජිකාවන්ට මෙම කරුණු සම්බන්ධව ස්තුති කළ යුතුය.
- විශේෂ ස්තුතිය - උත්සවය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය ලබාදීම පිළිබඳව එහි අධ්‍යක්ෂතුමියටද හා සංවත්සර උත්සවය සඳහා ලබාදුන් විවිධ සහාය වෙනුවෙන් දර්ශන කුමාර. මාධවී රාජපක්ෂ, සුමුදු සුජීවනී, දීපිකා බණ්ඩාරනායක හා කපිල විජේතුංග යන කෞතුකාගාර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් හටද ස්තුති කරමු.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා - වෙළුම 6 (2016)




ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා 6 වැනි වෙළුම විශේෂ කලාපයක් ලෙස ස්වර්ණ ජයන්ති සංවත්සරය වෙනුවෙන් ප්‍රකාශයට පත් විය. ශාස්ත්‍රීය ලිපි හයකින් හා ස්වර්ණ ජයන්ති අතිරේකයෙන් යුක්ත මෙම කලාපය පිටු 102කින් සමන්විතය. එහි සංස්කාරක ලෙස කටයුතු කළේ ධනේෂ් විසුම්පෙරුම මහතාය. සංහිතා 6 වැනි වෙළුමේ ඇතුළත් ලිපි මෙසේය.

- ශ්‍රී ලාංකේය සමාජයේ සාපරාධී අපරාධ සහ නීතිය - ආචාර්ය එන්. ඒ. විමලසේන
- පධානඝරවල වාස්තු විද්‍යා ලක්ෂණ - යුරේන් අතුකෝරළ
- මහාවංස සංස්කරණවල තාක්ෂණික ස්වභාවය පිළිබඳ විමසුමක් - මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ
- Sinhala and Tamil Aluth Avurudda: the Spring Festival - Dr. Kavan Ratnatunga
- Archaeological Remains of the Fort of Colombo - H.M. Chryshane Mendis
- සංස්කෘති ආයතනය භාරයේ ඇති පී. වීරසිංහ එකතුවේ ඇති ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයට අදාළ ලිපි ලේඛන සමූහයක් - ධනේෂ් විසුම්පෙරුම
- ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය - ස්වර්ණ ජයන්ති අතිරේකය (සංගමයේ ඉතිහාසය පිළිබඳ සංක්ෂිප්ත ලිපියක් හා සංගමයේ හිටපු සභාපතිවරුන් පස් දෙනාගේ කෙටි චරිතාපදාන එකතුවක්)
- ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ කටයුතු සාරාංශය (2014-2016)

**සඟරාව ලබාගැනීම සඳහා -** ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා සඟරාවේ සාමාන්‍ය මිල රු. 250කි. **සාමාජිකයන් සඳහා රු. 220ක විශේෂ මිලකට සංගමයේ රැස්වීම්වලදී ලබාගත හැකිය.** සඟරාව ලියාපදිංචි තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා ගෙවන කාර්යාලය **කොළඹ ජාතික කෞතුකාගාරය** ලෙස හා ගෙවීම ලබන්නා **සංජීවනී විද්‍යාරත්න** ලෙස සඳහන් කළ රු. 300/= ක මුදල් ඇණවුමක් සමග ඔබේ නම, ලිපිනය හා දුරකථන අංකය ඇතුළත් ලිපියක් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

සංජීවනී විද්‍යාරත්න මිය
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය පිළිබඳ කෘතිය

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය පිළිබඳ කෘතියක් සම්පාදනය කිරීමට සංගමයේ ගරු සංස්කාරක, හා හිටපු සමලේකම් (1999-2006) ධනේෂ් විසුම්පෙරුම කටයුතු කරයි. එය සංගමය හා වෙනත් ආයතන සතු සංගමයේ ඉතිහාසය හා සම්බන්ධ ලිඛිත මූලාශ්‍රය ආශ්‍රයෙන් සම්පාදනය කරනු ලබන්නකි. විධායක සභාවේ අනුමැතියෙන් සංගමය මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිත එම කෘතියට පහත සඳහන් කරුණු ඇතුළත්ය.

- සංගමයේ ආරම්භය, නාමය හා පරමාර්ථ, ව්‍යවස්ථාව, සංගමයේ සාමාජිකත්වය, නිලධාරි මණ්ඩල විකාශනය වූ ආකාරය හා ප්‍රධාන තනතුරු දැරූ නිලධාරීන්, සංගමයේ රැස්වීම් පිළිබඳ තොරතුරු, සංගමයේ දේශන මාලාවේ ආරම්භය හා මෙතෙක් පැවැති දේශන නාමාවලිය, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා සඟරාවේ ආරම්භය හා විකාශනය, සඟරාවල පළ වූ ලිපි නාමාවලිය, සංගමයේ සෙසු ප්‍රකාශන පිළිබඳ විස්තර, ඩිජිටල් ප්‍රකාශන, සංගමය මගින් පැවැත්වූ සම්මන්ත්‍රණ, විවිධ සංවත්සර වැඩසටහන්, ප්‍රදර්ශන, අධ්‍යයන චාරිකා, පැවැති වෙනත් වැඩසටහන්, සංගමයේ ජාතික මට්ටමේ මැදිහත්වීම්, දේපළ හා මූල්‍ය කටයුතු පිළිබඳ තොරතුරු, සංගමයට ලැබුණු අනුග්‍රහ පිළිබඳ විස්තර හා 2016 වන විට යාවජීව සාමාජිකත්ව නාමලේඛනය මීට ඇතුළත්ය. (යාවජීව සාමාජිකත්ව නාමලේඛනය ජනවාරි මස 25 දින වන විට වෙබ් අඩවියට එක් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. අප පදනම් කරගන්නේ සාමාජික අයදුම්පතේ ඇතුළත් නම බැවින් ඔබේ නම නිවැරදිදැයි පරීක්ෂා කර එහි වෙනසක් සිදුවිය යුතු නම් පෙබරවාරි මස රැස්වීමේදී හෝ පෙබරවාරි මස 20 දිනට පෙර සංස්කාරක අමතන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. දුරකථනය: 071-4310794, විද්‍යුත් තැපෑල: dhaneshw@gmail.com)

**සංගමය පිළිබඳ වැදගත් තොරතුරු රැසකින් හා ඡායාරූපවලින් යුක්ත පිටු 80කින් පමණ සමන්විත කෘතිය 2017 මාර්තු මස වාර්ෂික මහා සභා රැස්වීමේදී එළිදැක්වීමට අදහස් කෙරේ. එය සාමාජිකයන් සඳහා අලෙවි කිරීමට අදහස් කරනු ලබන්නේ රු. 200/=කටය.** මුද්‍රණය කරනු ලබන්නේ සීමිත පිටපත් ප්‍රමාණයක් බැවින් ඔබේ පිටපත කලින් වෙන්කර ගැනීම සඳහා පහත දැක්වෙන ආකෘති පත්‍රය පුරවා අදාළ මුදල සමග පෙබරවාරි මස රැස්වීමේදී හෝ ඊට පෙර ගරු භාණ්ඩාගාරික වෙත ලබාදී ලදුපතක් ලබාගත යුතුය. (ලියාපදිංචි තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා ගරු සංස්කාරක ධනේෂ් විසුම්පෙරුම 071-4310794 අංකයෙන් අමතන්න. තැපැල් ගාස්තුව සමග පිටපතක මිල රු. 280/=කි.)

---

### ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය කෘතියේ පිටපත් වෙන් කරගැනීම

| | | | |
|---|---|---|---|
| නම | | | |
| ලිපිනය | | | |
| දුරකථන අංකය | | | |
| අවශ්‍ය පිටපත් ගණන | | | |
| ගෙවනු ලබන මුදල | | ගෙවනු ලබන ආකාරය | මුදල්/ චෙක්පත්/ |
| අත්සන | | දිනය | |

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
archaeology.org.lk@gmail.com
වෙබ් අඩවිය -
www.archaeology.org.lk

- ගරු සභාපති
  මහින්ද මලලසේකර 072-3322411
- ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
  රංජිත් හේවගේ 071-1712894
- ගරු උප සභාපති
  කාවන් රත්නතුංග 071-7072020
- ගරු සමලේකම්වරු
  සමන් අබේසිංහ 071-4864783
  බැනට් ප්‍රනාන්දු 071-8335882
- ගරු සම්බන්ධීකරණ ලේකම්
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- ගරු භාණ්ඩාගාරික
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- ගරු සංස්කාරක
  ධනේෂ් විසුම්පෙරුම 071-4310794


## නිවේදන

- සාමාජික අයඳුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- පුරාවිද්‍යා සංහිතා 2, 3 හා 5 කලාප සංගමයේ රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් Subject ලෙස Add යොදා, සාමාජික අංකය සඳහන් කර ඉහත සඳහන් සංගමයේ ඊ-මේල් ලිපිනයට ඊ-මේල් පණිවුඩයක් එවන්න.

## පුරාවිදු පුවත් සංස්කරණය


ධනේෂ් විසුම්පෙරුම
ගරු සංස්කාරක
dhaneshw@gmail.com


# සංවත්සරය සඳහා පරිත්‍යාග කළ සාමාජිකයින්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්ති සංවත්සරය සඳහා පරිත්‍යාග කරන මෙන් ඉල්ලා සිටිමින් 2015 අගෝස්තු මාසයේදී සංගමය විසින් සියලු සාමාජිකත්වයෙන් සිදු කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් පහත නම් සඳහන් සාමාජිකයන් හා ආයතනවලින් ආධාර මුදල්, ත්‍යාග වවුචර් හා පොත් සංගමය වෙත ලැබිණි.

- මහාචාර්ය විනී විතාරණ
- ආචාර්ය මහින්ද පී. මලලසේකර
- ආචාර්ය කාවන් රත්නතුංග
- වෛද්‍ය බී. ජී. ඒ. විද්‍යාතිලක
- නීතිවේදී පීම් මාරඹේ
- Archaeology.lk වෙබ් අඩවිය
- ආචාර්ය හේමා ගුණතිලක
- ධනේෂ් විසුම්පෙරුම
- ජනක තෙවින් දිසානායක
- උරුමය අධ්‍යයන ආයතනය
- ඉරෝෂා නානායක්කාර
- රංජිත් හේවගේ
- සංජීවනී විද්‍යාරත්න
- ඩබ්ලිව්. රොබට් ගුණතිලක
- යොහාන් පෙරෙයිරා
- ඊ. කේ. හේමතිලක බණ්ඩාර
- කේ. එම්. එච්. කරුණානායක
- එන්. ආර්. එස්. විජේවර්ධන
- ආනන්ද රන්පටිදේව
- බී. බෙවන්ස්
- නම සඳහන් නොකරන මෙන් ඉල්ලා සිටි සාමාජිකයෙක්
- සී. හරිශ්චන්ද්‍ර ඉද්දගොඩ
- ආර්. ඒ. සුනිමල් රංජිත් කුමාරතුංග
- කේ. බැනට් ප්‍රනාන්දු
- පියසේන රණවීර
- කේ. වී. ඇල්ෆ්‍රඩ්

මේ අනුව 2015 අගෝස්තු සිට 2016 සැප්තැම්බර් දක්වා පරිත්‍යාගශීලීන්ගෙන් සංගමය වෙත පරිත්‍යාග ලෙස ලැබුණු මුදල රු. 107,500/= කි.

මීට අමතරව ත්‍යාග වවුචර්පත් හා පොත්ද පරිත්‍යාග ලෙස ලැබිණි. ත්‍යාග වවුචර්පත් දේශන පැවැත්වූ දේශකවරුන් සඳහා තිළිණ ලෙස සහ රචනා තරඟවල ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ලෙස ලබාදෙන ලදී. පරිත්‍යාග ලෙස ලැබුණු පුරාවිද්‍යාව හා ඉතිහාසය පිළිබඳ ලියැවුණු පොත් එකතුවක් බැගින් රචනා තරඟයේ ජයග්‍රාහයකයන්ට හා කුසලතා දැක්වූ තරඟකරුවන්ට ත්‍යාග ලෙස ලබා දෙන ලදි.

**මෙම සියලු පරිත්‍යාග ස්වර්ණ ජයන්ති සංවත්සරය සාර්ථක කරගැනීම සඳහා මහත් සේ ප්‍රයෝජනවත් වූ බව සඳහන් කළ යුතුය. එබැවින් ඉහත නම් සඳහන් පරිත්‍යාගශීලීන් සියලුදෙනාටම ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය සිය කෘතඥතාව පිරිනමයි.**


**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.